2020 ඔක්තෝබර් 20

**ශ්‍රී ලංකාව: කෝවිඩ් 19 වසංගතයට ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රනය මිලිටරිකරණය වීම හේතුවෙන් අසරණ ජනතාව විපාක විඳිති.**

අන්තර්ජාතික නීති විශාරදයන්ගේ කොමිසමේ, ආසියා ශාන්තිකර වැඩසටහනේ නීති උපදේශක බෝරම් ජැන්ගේ අදහස් දැක්වීමකි.

බ්‍රැන්ඩික්ස් නිමි ඇඳුම් කර්මාන්තශාලාවේ සේවකයන් සියගණනක් කොවිඩ් 19 ආසාදිතයන් ලෙස වාර්තා වීමෙන් පසු, 2020 ඔක්තෝබර්මස 15 වන දින , ශ්‍රීලංකා රජය විසින් කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සමහරක් ප්‍රදේශ වලට ඇඳිරිනීතිය පනවනු ලැබීය. ඔක්තෝබර් 9 වෙනිදා සිට එම ඇඟලුම් කම්හලෙහි ආශ්‍රිතයන් 1500 කට අධික පිරිසක් ආසාදිතයන් බවට සොයාගැනුණු අතර තවත් ඇඟලුම් කම්හල් හතරක්, එනම් ජීෆ්වේ කටුනායක, නෙක්ස්ට් මනුෆෙක්චරින් , නෛගෙ සහ ඔකය ලංකා , යන කම්හල් වසා දැමිණි.

නිදහස වෙළඳ කලාපයේ බොහෝ සේවකයන් ශ්‍රී ලංකාවේ දුෂ්කර පළාත්වලින් පැමිණි අය වන අතර, ඔවුන් බොහෝ දෙනා, ඉඩකඩ සීමිත නේවාසිකයන් පිරී ගිය නාවතැන්පොලවල්හි ඉතාම අවම පහසුකම් යටතේ ජීවත්වෙයි. එවැනි ඇතැම් නවාතැන් වල ගැබිණි මවුවරුන් පවා වාසය කරන අතර ඇතැම් මවුරුන් සිය දරුවන්ද සමග ඒවායේ වාසයකරයි. කෝවිඩ් 19 මර්දනය කිරීමේ උත්සාහයක් ලෙස, ඔක්තෝබර් මස 11 වන දින, තාවකාලික නිරෝධායන මධ්‍යස්ථාන වෙත එම ඇඟලුම්කම්හල් සේවක සේවිකාවන් රැගෙන යාම සඳහා, රාත්‍රී කාලයේදී සහ පාන්දර යාමයේ ඔවුන් බලහත්කාරයෙන් එක්රැස් කිරීමේ කාර්ය සඳහා හමුදාව කැඳවනලදී. මාධ්‍ය සහ සිවිල් සංවිධාන වාර්තාවලට අනුව සොල්දාදුවන් විසින් ඇඟලුම් කම්හල්සේවකයන්ගේ නවාතැන්පොළවල් වටලා ඔවුන්හට සියලුදේ බෑග් වල අසුරාගෙන සූදානම්වීමට විනාඩි පහත් දහයත් අතර කාලයක් ලබා දෙන බවට පවසා ඇත. ඉන් අනතුරුව ඔවුන්ව සෙනග පිරී ගිය බස් රථවලට නංවාගෙන නිරෝධායන මධ්‍යස්ථාන ලෙස හැඳින්වූ ස්ථාන වෙත රැගෙන ගොස් ඇති, නමුත් එම ස්ථාන නීතිමය ක්‍රියාපටිපාටින්ට අනුව නිසි ලෙස සකස් කල ස්ථාන නොවේ.

එම ඇඟලුම් කම්හල් සේවකයන්හට, අදාළ නිරෝධායන මධ්‍යස්ථාන පිහිටා ඇත්තේ කොහේද යන වග වත් දැනුම් දී නොතිබූ අතර අවම තරමින් මුහුණු ආවරණ හෝ ලබා දී නොතිබිණි. එවන් තත්වයක් තුල, හමුදාවේ මෙම ක්‍රියාකලාපයට එරෙහිව වෘත්තීය සමිති සහ මානව හිමිකම් ක්‍රියාකාරීන් හඬ අවදි කළහ. එසේ රැගෙන ගිය ඇඟලුම් කම්හල් සේවක සේවිකාවන්ට කිසිවක් විමසීමට හෝ අදහස් දැක්වීමට අවස්තාව ලබා දී නොතිබූ අතර දරුවන් මවුවරුන්ගෙන් වෙන් කර තිබිණි . ඔවුන් නිරෝධායන මධ්‍යස්ථාන වෙත රැගෙන ගිය පසු ඔවුන්හට ආහාරයට යමක් ලබා දී ඇති නමුත් ඒවා ආහාරයට ගැනීමට ප්‍රියවන තත්වයේ නොතිබූ බව බොහෝ දෙනාගේ අදහසයි. ඔවුන් නිරෝධායන මධ්‍යස්ථානය වෙතරැගෙන යන විට එම ස්ථාන වල වැසිකිලි උතුරා ගොස් ඉතාම අපිරිසිදු තත්වයේ පැවති අතර, නිරෝධායන මධ්‍යස්ථානයට ඇතුල් කරන අවස්ථාවේ ඔවුන් කිසිවෙකුටත් PCR පරීක්ෂණ සිදු කර නැත . කෙටියෙන් කිවතොත් කෝවිඩ් 19 ආසාදනය වීමේ තර්ජනයට මිලිටරිකරණය වූ ප්‍රතිචාරයක් දැක්වීම මගින් ඇඟලුම් කම්හල් සේවකයන් ආසාදිතයන් බවට පත්වීමේ ඉහළ අවදානමකට භාජනය වූ අතර ඔවුන් නොයෙක් ආකාරයේ පහත් කොට සැලකීම් වලට භාජනය විය. මිලිටරිකරණය වූ ප්‍රතිචාරය හේතුකොටගෙන සිදුවන, කිසිසේත්ම අනුමත කල නොහැකි, අන්‍යාන් පෙලන ආකාරයේ හැසිරීම්, පිළිබඳව නිරන්තරයෙන් ඇසීමට සිදුවන අවස්ථාවක, මෙම මහජන සෞඛ්‍ය අර්බුදය හමුවේ ඉදිරියට යාමේදී වඩාත් යෝග්‍ය වන්නේ වසංගතයට අප දක්වන ප්‍රතිචාර මානව හිමිකම් මුලධර්ම වලට අනුකුල වන බව තහවුරු කිරීමයි. ශ්‍රී ලංකා රජය සහ හමුදාව විසින් මෑත කාලීනව ඇඟලුම් කම්හල් සේවකයන් අතර වසංගත පැතිරීම් තත්වය පාලනය කිරීමට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව ගැටලුකාරී තත්වයක් ඇති වී ඇත. සේවකයන් හට ප්‍රමාණවත් පැහැදිලි තොරතුරු ලබා නොදීම, අනතුරුදායක ප්‍රවාහනය, නීත්‍යානුකුල ක්‍රියාපටිපාටීන්ට පරිබාහිරව පිහිටුවන ලද අපිරිසිදු නිරෝධායන මධ්‍යස්ථාන, සේවකයන් බස්රථ වලට නැංවීමට පෙර සහ නිරෝධායන මධ්‍යස්ථාන වලට ඇතුළුකිරීමට පෙර PCR පරීක්ෂණ සිදු නොකිරීම සහ අධිකරණමය අධීක්ෂණයකින් තොරව යන තත්වයන් රජය විසින්ම පනවා ඇති කෝවිඩ් 19 නීති රෙගුලාසි පැහැදිලි ලෙස උල්ලංඝනය කරයි . මේ සියලු කරුණු කේන්ද්‍රගත වී ඇත්තේ බරපතල ලෙස මිලිටරිකරණය හා දේශපාලනීකරණය වූ කෝවිඩ් 19 ප්‍රතිචාර වැඩපිළිවෙල වටායි.

මාර්තු මාසයේදී , ශ්‍රී ලංකාවේ පළමු කෝවිඩ් 19 රෝගියා වාර්තා විය . රෝගය පැතිර යාම වැලැක්වීම පිණිස රජය විසින් කෝවිඩ් 19 පැතිරීම වැළක්වීමේ ජාතික මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී. කෙසේවෙතත්, වෛද්‍ය වෘත්තිකයන් හෝ සිවිල් සේවකයන් වෙනුවට එම මධ්‍යස්ථානයේ ප්‍රධානියා ලෙස, රාජපක්ෂ ආණ්ඩුව විසින් පත් කරන ලද්දේ යුධ අපරාධ චෝදනා ලබා සිටින ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වායි. එක්සත්ජාතීන්ගේ සංවිධානයේ විමර්ශන කණ්ඩායම් රැසක් විසින් හඳුනා ගත් ආකාරයට ශ්‍රී ලංකාවේ දශක ගණනාවක් පුරා පැවති, 2009 වර්ෂයේ අවසන් වූ, යුද්ධයේදී දරුණු අපරාධ සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සිදු කල බවට සැක කෙරෙන ශ්‍රී ලංකා හමුදාවේ 58 වන සේනාංකයේ අණ දෙන නිලධාරියා වුයේද ශවේන්ද්‍ර සිල්වයි. ජනාධිපති රාජපක්ෂ මහතා විසින් රජයේ තවත් ප්‍රධාන තනතුරු රාශියකට විශ්‍රාම ලත් හා දැනට සේවයේ නියුතු හමුදා නිලධාරීන් පත් කර තිබේ. එකී තනතුරු අතර සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම් තනතුර, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර මෙන්ම ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරද වේ.

සති කිහිපයක් ප්‍රමාද වීමෙන් පසු, රට පුරාම බල පැවැත්වෙන පරිදි මාර්තු 20 වන දින සිට ඇඳිරි නීතිය පනවන ලදී. එහෙත් ඒ වන විට ජනතාව වෙත අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් නොතිබිණි. ජනාධිපතිතුමා විසින් ඇඳිරි නීතිය උල්ලංඝනය කරන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම සඳහා පොලීසිය වෙත සම්පූර්ණ බලය පවරන ලදී. 60,000 කට අධික පිරිසක් මෙසේ අත්අඩංගුවට පත් වූ අතර, ඔවුන් ඇප මත මුදා හැරුණද , කෝවිඩ් 19 තත්වය යහපත් අතට පත් වූ පසු නීතිපතිතුමාගේ උපදෙස්මත ඔවුනට එරෙහිව නඩු පැවරීමට කටයුතු කරන බව පොලිසිය සඳහන් කළේය. එම පුද්ගලයන්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයකදී නඩු පැවරිය හැකි අතර, ඔවුන් වරදකරුවන් ලෙස තීන්දු වුවහොත් මාස හයක් දක්වා වන සිර දඬුවමකට සහ රුපියල් දෙදහසක මුදල් දඩයකට යටත්වේ. එම ඇඳිරි නීතියෙහි නීත්‍යානුකූල වලංගුභාවය පිළිබඳව නීති සම්පාදකයන් අතර වාද විවාද ඇති වුවද , කොරෝනා වෛරසය මැඩපැවැත්වීමේ රාජ්‍ය යාන්ත්‍රණයේ එක් පියවරක් ලෙස ප්‍රදේශ කිහිපයකම එම ඇඳිරිනීතිය දිගින් දිගටම ක්‍රියාත්මක වුනි.

මහජන සෞඛ්‍ය අර්බුදයක් ඇතුළු හදිසි තත්වයකදී හමුදාව හට නීතිය ක්‍රියාත්මක කිරීම හා බැඳුනු විවිධ කාර්යයන් සිදු කිරීමට සිදුවන අවස්ථා තිබෙන්නට පුළුවන. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මාර්ගෝපදේශන අනුව , හමුදාව නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා යොදා ගත හැක්කේ සීමිත කාල සීමාවක් තුල විශේෂයෙන් හා පැහැදිලිව නම් කල අවස්ථාවන්හිදී පමණක් විය යුතුය. හමුදාව විසින් නීතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් වල නියලීමේදී , ඔවුන් සිවිල් අධිකාරීන්ට යටත් විය යුතු අතර සිවිල් නීතියට වග විය යුතුය. එසේම නීතිය ක්‍රියාත්මක කරන සෑම නිලධාරියෙකුටම අදාළ වන අන්තර්ජාතික මානව හිමිකම් නීතියේ සියලු ප්‍රමිතීන්ට ඔවුන්ද යටත් විය යුතුය.

කෙසේවෙතත්, අද වන විට ශ්‍රී ලංකාවේ, කෝවිඩ් 19 වැළක්වීමේ යාන්ත්‍රනය තුල මිලිටරිකරණය වූ ක්‍රියාවන් සහ තීරණ පිළිබඳව කිසිදු පාරදෘශ්‍යභාවයක් හෝ සමාජ කතිකාවතක් නැත. මහජන සෞඛ්‍ය පිලිබඳ සියලු තීරණ ගනු ලබන්නේ ශවේන්ද්‍ර සිල්වා ප්‍රමුඛ කෝවිඩ් 19 පැතිරීම වැළක්වීමේ ජාතික මධ්‍යස්ථානය මගිනි. ඒ සඳහා පාර්ලිමේන්තු හෝ අධිකරණමය අධීක්ෂණයක් නොමැති අතර එකී තීරණ පිළිබඳව දැනුවත් කෙරෙන හා ඔවුන් එකී තීරණ වලට වගකීමෙන් බැඳෙන ආකාරයේ මහජන ආයතනිකමය ක්‍රියාපටිපාටීන් කිසිවක්ද නොමැත.

මෙම මිලිටරිකරණය වූ මහජන සෞඛ්‍ය වැඩපිළිවෙල හේතුවෙන් අසරණකමින් පෙලෙන ජනවර්ග සහ ආගමික කොටස් දැඩි අයහපත් බලපෑමකට මුහුණ දී තිබේ. උතුරු නැගෙනහිර නිර්හමුදාකරණය කිරීම සඳහා ද්‍රවිඩ සංවිධාන සහ දේශපාලඥයින් දිගින් දිගටම ඉල්ලීම් කර තිබේ. මහජන සෞඛ්‍ය ප්‍රතිපත්තිය පිලිබඳ අධීක්ෂණය කිරීම සහ රජයේ මුල් පෙල ප්‍රතිචාර කණ්ඩායම ලෙස කටයුතු කිරීම, හමුදාවට භාර දීම මගින්, මිලිටරිකරණය සාමාන්‍යකරණය වන අතර පවත්නා ජනවර්ග අතර බෙදීම් තවත් උත්සන්න කරමින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තවදුරටත් වියැකී යන තත්වයට පත් කෙරේ.

ලංකාවේ බොහොමයක් නිරෝධායන මධ්‍යස්ථාන පිහිටා ඇත්තේ උතුරු සහ නැගෙනහිර පළාත්වලයි. ඒවා තවමත් හමුදාව සන්තකයේ පවතී.

ජනවාර්ගික හා දේශපාලන මත ගැටුම් පවතින ප්‍රදේශ වල නිරෝධායන මධ්‍යස්ථාන ඉදිකිරීම සම්බන්ධයෙන් එම ප්‍රදේශ වල ජනතාවගේ ඇති අකමැත්ත නොසලකා රජය විසින් එම ප්‍රදේශ වල පාසල් සහ අධ්‍යාපන ආයතන නිරෝධායන මධ්‍යස්ථාන බවට පත් කර තිබේ.

තවද, ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව විසින් ද රජයේ නොගැලපෙන ප්‍රතිපත්තීන් සහ ඔවුන්ගේ ආගම ඇදහීමට ඇති අයිතිය උල්ලංඝනය කිරීම පිළිබඳව පැමිණිලි ඉදිරිපත් කර තිබේ. රජය විසින්, කෝවිඩ් ආසාදනය වී මරණයට පත් වූවන් ආදාහනය කිරීම අනිවාර්ය කල අතර, එය ඉස්ලාම් ආගමේ භූමදානය පිලිබඳ චාරිත්‍රයට මෙන්ම එක්සත්ජාතීන්ගේ සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශනයන්ටද පටහැනි වේ.

මහජන සෞඛ්‍ය අර්බුදයකදී, මානව හිමිකම් වලට යම් සීමා පැනවිය හැකි වුවද , එවැනි සීමාවන් සිරකුසා මූලධර්මයන්ට අනුකූලව, නියමිත මහජන සෞඛ්‍ය අරමුණක් උදෙසා නීතිමය පදනමක් ඔස්සේ පැනවිය යුතු අතරම, එවන් සීමාවන් මහජනතව පහත් කොට සැලකීම භාජනය නොවන අන්දමින්, අදාල මහජන සෞඛ්‍ය ගැටලුවට ප්‍රතිචාර දැක්වීමට අත්‍යවශ්‍ය හා සමානුපාතික විය යුතුය.

පාර්ලිමේන්තුවේ සහ සිවිල් සමාජයේ ඉතාම සීමා සහිත අධීක්ෂණයක් තුළ, ශ්‍රී ලංකා රජය සෑම මට්ටමකින්ම හමුදාව සහභාගී කරවා ගැනීම, මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍ය පිළිබඳව ගැටළු රාශියක් මතු කරයි. සංඛ්‍යාලේඛන සහ වසංගතය පැතිර යාම වැළැක්වීමේ උපාය මාර්ග සම්බන්ධයෙන් වෛද්‍ය අධිකාරීන්ගේ අදහස් වලට එකඟ විය නොහැකි බව මහජන සෞඛ්‍ය නිලධාරීන් ප්‍රකාශ කර තිබේ.

සාර්ථක මහජන සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවීම සඳහා මහජන විශ්වාසය සහ සහය දිනා ගැනීමට රජයට හැකි වන්නේ, වසංගතය මර්දනයට ගනු ලබන ප්‍රතිපත්තීන් සාක්ෂි මත පදනම් වූ, මානව හිමිකම් වලට අනුකූල වූ පාරදෘශ්‍ය ප්‍රතිපත්තීන් වන්නේ නම් පමණි